# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විසර්ජන (සංශෝධන)

**2022 අංක 43 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2023 ජූලි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ජූලි මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[190 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 43 දරන විසර්ජන පනතේ 2 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ රුපියල් බිලියන 4,979 වූ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 13,979 දක්වා වැඩි කිරීම මගින් සහ (4) වන උපවගන්තියේ රුපියල් 4,222,233,362,000 වූ සේවා වියදම් රුපියල් 13,222,233,362,000 දක්වා වැඩි කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ *වැය ශීර්ෂ* අංක 249 යටතේ දැක්වෙන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ *මූලධන වියදම් තීරයේ* අගය රුපියල් 2,019,970,000,000 සිට රුපියල් 11,019,970,000,000 දක්වා වැඩි කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

එල්.ඩී.-ඕ. 41/2023

## 2022 අංක 43 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2023 අංක    දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2022 අංක 43 දරන පනතේ දෙවන වගන්තිය සංශෝධනය කිරීම**

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 43 දරන විසර්ජන පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ ''රුපියල් බිලියන හාරදහස් නවසිය හැත්තෑ නවයක්'' යන වචන වෙනුවට ''රුපියල් බිලියන දහතුන්දහස් නවසිය හැත්තෑ නවයක්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ ''රුපියල් හාරදහස් දෙසිය විසිදෙක බිලියන දෙසිය තිස්තුන් මිලියන තුන්සිය හැට දෙදහසක්'' යන වචන වෙනුවට ''රුපියල් දහතුන්දහස් දෙසිය විසිදෙක බිලියන දෙසිය තිස්තුන් මිලියන තුන්සිය හැට දෙදහසක්'' යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ *වැය ශීර්ෂ* අංක 249 යටතේ දැක්වෙන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ *මූලධන වියදම් තීරයේ* ''2,019,970,000,000'' යන ඉලක්කම් වෙනුවට ''11,019,970,000,000'' යන ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.